ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා)උපාධි වැඩසටහන-පස්වන මට්ටම **2018/2019**

අවසාන පරීක්ෂණය - **2019**

අධ්‍යාපන මනෝ විද්‍යාව - **ESU3225/STU5525**

කාලය පැය තුනයි. **(03)**

---

දිනය - **2019.02.11** වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**1** වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, **2** වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට **(03)** ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. 'ඉගෙනුම් අපේක්ෂණ 'සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යාපන මනෝවිද්‍යාවෙන් ගුරුවරයාට ලැබෙන සහායන් තුනක් **(03)** දක්වන්න.

02. 'තීරණාත්මක අවධිය' යන්න නිදසුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

03. පුද්ගල සංවර්ධනයේ ප්‍රධාන අවධි, වයස් සීමාවන් සමඟ දක්වන්න.

04. ගුරුවරයෙකුට ළමා චර්යා අධ්‍යයන කිරීමේ ක්‍රමයක් ලෙස නිරීක්ෂණ භාවිත කළ හැකි අවස්ථා හතරක් **(04)** ලැයිස්තු ගත කරන්න.

05. සංයුක්ත ක්‍රියාකාරී චින්තන අවධියේ ළමුන්ට ඉගෙනීම් -ඉගැන්වීම් අවස්ථා සංවිධානය කිරීමේ දී ගුරුවරුන් විසින් පදනම් කරගත යුතු කරුණු හතරක් **(04)** සඳහන් කරන්න.

06. සිසුන් තුළ 'ස්වයං පෙළඹුම' සංවර්ධනය කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන පහක් **(05)** දක්වන්න.

07. මුල් ළමා වියේ සිටම ළමයින් සතු පරිකල්පන ශක්තිය සංවර්ධනය කිරීම සඳහා නාට්‍ය හා රංගකලා විෂය උගන්වන ගුරුවරයෙකුට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග දෙකක් **(02)** කෙටියෙන් පැහැදිලි කරන්න.

08. චර්යාවාදී ඉගෙනුම් න්‍යායයන්ට අනුව පුද්ගලයෙකු තුළ ඉගෙනුම සිදුවන්නේ කෙසේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05x 08 = 40)

## 2 වන කොටස

09. (i) 'පරිණතිය' යන සංකල්පය විස්තර කරන්න. (ලකුණු 03)

(ii) (අ) සුදුසු උදාහරණ දක්වමින් ඉගෙනුම සඳහා පරිණතිය බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ආ) ඉගෙනීම සිදුවීම කෙරෙහි පරිනතියට අමතරව බලපාන සාධක ගණනාවක් ඇත.

එසේ බලපාන සාධක දෙකක් **(02)** උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) ද්විතියික පාසල් අවධියේ සිසුන්ගේ සමාජ කුසලතා සංවර්ධනය සඳහා ගුරුවරුන්ට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග තුනක් **(03)** නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 3 x 3 = 09)

10. (i) 'චිත්තවේග' යන්න නිර්වචනය කරන්න. (ලකුණු 04)

(ii) ප්‍රාථමික චිත්තවේග සහ ද්විතීයික චිත්තවේග අතර ඇති වෙනස්කම් උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) 'චිත්තවේග' සිසුන්ගේ ඉගෙනීම හා සම්බන්ධ අවධානය, සංජානනය, මතකය හා ගැටළු විසඳීම වැනි ප්‍රජානන ක්‍රියාවලීන් කෙරෙහි බලපායි.

(අ) චිත්තවේග ඉහත දැක් වූ ප්‍රජානන ක්‍රියාවලීන් කෙරෙහි හිතකර ලෙස බලපාන ආකාරය, (ලකුණු 06)

(ආ) එම ප්‍රජානන ක්‍රියාවලීන් කෙරෙහි අහිතකර ලෙස බලපාන ආකාරය

උදාහරණයක් බැගින් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

11. (i) කර්ට් ලෙවින් (Kurt Lewin)ගේ ක්ෂේත්‍ර ඉගෙනුම් න්‍යායට අනුව පුද්ගලයෙකුගේ ඉගෙනීම කෙරෙහි බලපාන ක්ෂේත්‍ර තුන **(03)** කෙටියෙන් විස්තර කරන්න.
(ලකුණු 03)

(ii) නාට්‍ය හා රංගකලා විෂයයට අදාලව කැමති ශ්‍රේණියකින් (6 – 11) සුදුසු පාඩම් මාතෘකාවක් තෝරා ගන්න.එම පාඩම සඳහා ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීමේ දී කර්ට් ලෙවින්ගේ (Kurt Lewin) න්‍යායයේ සඳහන් වුණු එක් එක් ක්ෂේත්‍රයේඅදාලත්වය සහ එක් එක් ක්ෂේත්‍රයට අදාලවන පරිදි ගුරුවරයෙකු විසින් ගත යුතු ක්‍රියාමාර්ග උදාහරණ දෙකක් **(02)** බැගින් පැහැදිලි කරන්න.

( 3 x 3 = ලකුණු 09)

(iii) ඉහත ( ii ) හි සඳහන් කළ ආකාරයට ක්‍රියාමාර්ග ගැනීමේ දී ගුරුවරයෙකුට මුහුණ පෑමට සිදුවන ගැටලු දෙකක් **(02)** කෙටියෙන් පැහැදිලි කොට එම ගැටළු මඟහරවා ගැනීමට ගතයුතු ක්‍රියාමාර්ග දෙකක් **(02)** බැගින් සාකච්ඡා කරන්න.

( 2 x 4 = ලකුණු 08)

12. (i) 'සමබර පෞරුෂය' යන සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ශිෂ්‍ය පෞරුෂ සංවර්ධනය පිළිබඳ ගුරුවරයෙකු දැනුවත්වීම අවශ්‍ය වන්නේ ඇයිදැයි දැක්වීමට හේතු තුනක් **(03)** දක්වන්න. ( 2 x 3 = ලකුණු 06)

(iii) සිසුන් තුළ සමබර පෞරුෂයක් සංවර්ධනය කිරීම සඳහා නාට්‍ය හා රංගකලා ගුරුවරයාට දායක විය හැකි ආකාර දෙකක් **(02)** උදාහරණ මඟින් පැහැදිලි කරන්න. ( 5 x 2 = ලකුණු 10)

13. (i) එකම පාඩම පන්තියක සිටින සිසුන් විවිධාකාරයෙන් සංජානනය කළ හැක. මීට හේතු තුනක් **(03)** පැහැදිලි කරන්න. ( 2 x 3 = ලකුණු 06)

(ii) සිසුන් තුළ 'සංජානනය' සුසාධ්‍යකරණය කිරීම සඳහා ගුරුවරයෙකුට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් **(02)** පැහැදිලි කරන්න. ( ලකුණු 05)

(iii) ඕනෑම ශ්‍රේණියක නාට්‍ය හා රංගකලා විෂයට අදාල පාඩමක් තෝරාගෙන එහි ඇති විෂයය කරුණු සිසුන්ට මතක තබා ගැනීම පහසු කිරීම සඳහා ඔබ එම පාඩම තුළ අනුගමනය කරන ක්‍රියාමාර්ග තුනක් **(03)** විස්තර කරන්න.

( 3 x 3 = ලකුණු 09)

14. (i) පිළිගත් නිර්වචනයක් භාවිත කරමින් 'පෙළඹීම' විස්තර කරන්න. (ලකුණු 05)

(ii) සමාජ ඉගෙනුම් ප්‍රවේශයේ මූලික මූලධර්මවලට අදාළව සිසුන්ගේ පෙළඹවීම ඇතිවන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) සිසුන් තුළ ස්වයං පෙළඹීම සංවර්ධනය කිරීමට පන්තිකාමරය තුළ නාට්‍ය හා රංගකලා ගුරුවරයෙකුට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග තුනක් **(03)** සාකච්ඡා කරන්න.

( 3 x 3 = ලකුණු 09)

හිමිකම් ඇවිරිණි.